අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගය - 2020

# JMC ආයතනය මෙහෙයවන සිංහල සම්මන්ත්‍රණය

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

11 ශ්‍රේණිය | කාලය පැය 01 යි

සැලකිය යුතුයි :
(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම **ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
**(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**

- අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **ඉරි ඇඳි** කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. නිලධාරීන්ගේ නොසැලකිල්ල නිසා යෝජනා **හමස් පෙට්ටියට** යන බව වෘත්තීය සමිති සාමාජිකයෝ පැවසූහ.
   1. සෙමින් ක්‍රියාත්මක වීම 2. වැරදි ලෙස ක්‍රියාත්මක වීම
   3. ක්‍රියාත්මක වීම කල් ගත වීම 4. ක්‍රියාත්මක නොවීම

**2.** **මෝල් ගස් ගිලපු පිඹුරා** වගේ අර ඉන්නේ කවුද'යි ඔහු මගෙන් ඇසීය.
   1. ආවේගශීලීව 2. අහංකාරයෙන් මත් වී 3. උකටලීව 4. බෙහෙවින් සතුටට පත්ව

3. එය **කණාමැදිරි එළියෙන් නිදන් සෙවීමක්** බව ගුරුතුමා කීය.
   1. දුෂ්කර කාර්යයක් 2. පහසු කාර්යයක් 3. නොවැදගත් කාර්යයක් 4. වැදගත් කාර්යයක්

4. කූට වෙළෙන්දෝ තම මඩිය තර කර ගැනීම සඳහා විවිධ උපක්‍රම යොදා පාරිභෝගිකයන් රවටති.
   1. සුදුසු ක්‍රම අනුගමනය කිරීම 2. කුස පිරෙන තෙක් ආහාර ගැනීම
   3. අනිසි ලෙස ලාභ ලැබීම 4. වංචා සහගත ලෙස කටයුතු කිරීම

- අංක 5 සිට 9 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

5. හෙළයේ මහා ගත්කරු නමින් ................ ලැබූ මාර්ටින් වික්‍රමසිංහ පළමු යථාර්ථවාදී නවකතාවේ කතුවරයා වේ.
   1. අනගි නාමය 2. අභිතනාමය 3. අන්වර්ථ නාමය 4. විරුදාවලි

6. කොළඹ දෙවන පරපුරේ කවීන් උපමා තැනුවද එම කවිවල .................... දක්නට නොවීය.
   1.දියුණුවක් 2. වර්ධනයක් 3. පිබිදීමක් 4. සංයමයක්

7. මහත්මා ගාන්ධිතුමා ඉන්දියාව සුදු පාලනයෙන් මුදා ගැනීමට ගත් උත්සාහයෙන් හෙළි වන්නේ එතුමාගේ .............. ධෛර්යයි.
   1. අපරිමිත 2. අප්‍රතිහත 3. දූරදර්ශී 4. අනවරත

8. ආපදා යනු හදිසියේ සිදුවන විශාල අවාසනාවන්ත ............................ කි.
   1. ව්‍යසනය 2. ව්‍යාවෘතය 3. ව්‍යායාමය 4. ව්‍යුත්පන්නය

9. අවතැන් වූවන් ............................ කිරීමේ කඩිනම් වැඩපිළිවෙළක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරිණි.
   1. පුනර්ජීවය 2. ප්‍රතිසංස්කරණය 3. පුනරුත්ථාපනය 4. ප්‍රතිපාදන

- අංක 10 සිට 11 තෙක් ඇති ප්‍රශ්නවල **ඉරි ඇඳි** කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

10. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් ලාංකේය සිනමාවේ <u>ප්‍රගමනයට</u> අමිල මෙහෙවරක් කළේය.
 1. නිපැයුමට  2. ඉදිරි ගමනට  3. පැවැත්මට  4. කලාත්මක සිනමාවට

11. තීරණයක් ගැනීමට පෙර ලද සියලු තොරතුරු **<u>ගවේෂණය</u>** කළ යුතු බව ලේකම්වරයා පැවසීය.
 1. ගැඹුරින් සොයා බැලීම  2. කෙටි කර දැක්වීම
 3. සවිස්තරාත්මක ව දැක්වීම  4. නිවැරදි ව ඉදිරිපත් කිරීම

- සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.

12. 1. අත්‍යවශය, සාමර්ථ්‍යය, ආදි, ධූරය  2. දුරස්ථ, විශිෂ්ට, වර්ධනය, ප්‍රත්‍යයාර්ථ
 3. අවස්ථාවෝචිත, ඓතිහාසික, දූරකතනය, තුෂ්ණීම්භූත  4. වර්තමාන, උෂ්ණ ,මැනික් ,සමස්ථ

13. 1. කණිෂ්ට, පරිගණක, වළාකුළ, තාක්ෂණය  2. කර්තෘ, ළැව්ගිනි, පිළිවෙළ, ගෘහස්ථ
 3. ව්‍යංගාර්ථය, දෝෂාභියෝගය, මහළු, දුශ්කර  4. ආධුනික, මැතිණිය, ළදරුපාසල, නෂ්ඨාවශේෂ

14. අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.
 1. කුමාරගම, ගුණසිංහ, සේනානායක, සේකර  2. ගුණසිංහ, කුමාරගම, සේකර, සේනානායක
 3. සේනානායක, සේකර, ගුණසිංහ, කුමාරගම  4. කුමාරගම, ගුණසිංහ, සේකර, සේනානායක

15. තාලුජාක්ෂරයක් යෙදී නැති වචනයක් සහිත පද පෙළිය තෝරන්න.
 1. ඉර, චන්ද්‍රයා, දර්ශනය, ඡන්දය  2. ටයරය, ශතකය, ජලය, සජ්ඣායනය
 3. ඥාණය, ඊශ්වර, කළය, චරිතය  4. සාකච්ඡාව, ශෛලිය, දූරකතනය, ප්‍රබල

16. සෑම වචනයකම මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති පද පෙළිය තෝරන්න.
 1. පෘථිවිය ,සජ්ඣායනය , නළය ,සම්බන්ධය  2. විභාග ,විශේෂ ,එළදායි ,සංස්ථාව
 3. ඓක්‍යය ,නිශ්චිත, විද්‍යාව ,සෞඛ්‍යය  4. ප්‍රධාන , අඛණ්ඩ, කනිෂ්ඨ , අභියෝග

17. වැරදි ලෙස විසන්ධි කොට ඇති පද ඇතුළත් පද පෙළිය පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. අත් + ඉන්, | ගස් + ඒ, | දුක් + පත්, | වි + අවුල් |
| 2. ගඟ + දිය, | අනු + රුත්, | දෑ + අත, | පල + අපල |
| 3. රද් + ගම, | දුම් + කොළ, | බුදු + සරණ, | කිරිමැටි + ආන |
| 4. නෙළුඹු + මල්, | මහ + මුලා, | අඹ + මල්, | ළිප් + ගල |

- පහත එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

18. පළිගත නොහැකි නිසා පිළිගැනීම.
 1. අත දීලා දත නියවීම  2. වඳින්ට ගිය දේවාලෙ ඉහේ කඩා වැටීම.
 3. කපන්ට බැරි අත සිඹීම.  4. දෙබරෙට ගල් ගැසීම.

19. තමා සතු දේ අනුන්ට දී වෙනත් අයගෙන් එය ලබන්නට උත්සාහ කිරීම.
 1. දේසේ හැටියට බාසේ  2. අත දීලා දත නියවීම
 3. අනුන්ගෙ පානින් එළිය බැලීම  4. අඬුව තියෙද්දි අත පුළුස්සා ගැනීම

20. යම් කටයුත්තක් අපිළිවෙළට සිදුකිරීම,
 1. කළුවා මාරපන ගියා වගේ  2. යකාගේ කටේ දත් හිටෙව්වා වගේ
 3. නටන්න බැරි මිනිහට පොළොව ඇදයි වගේ  4. දොඩම් ගොඩ බඳා ගත්තා වගේ

21. <u>අන්‍යාර්ථ සමාසයකට</u> උදාහරණයක් වන්නේ,
 1. තිනෙත්  2. අනෞචිත්‍යය  3. කළු සුද්දා  4. සුමිත්

22. **<u>භාවික ගුණයෙන්</u>** පිරිපුන් වචන යොදා ගැනීම සාහිත්‍යකරුවා යොදා ගන්නා භාෂාවේ විශේෂ ලක්ෂණයකි. ඉරි ඇඳි පදයේ අර්ථය වන්නේ,
 1. භාවිත හැකියාවෙන්  2. සැඟවුණ අර්ථයන්ගෙන්
 3. හැඟීම් දැනවීමේ ශක්තියෙන්  4. මතුපිට අර්ථයන්ගෙන්

23. වරක් කියූ දෙය නැවත නැවත කීම උසස් පද්‍ය රචනයක ලක්ෂණයක් නොවේ යැයි කාව්‍ය විචාරකයෝ පවසති. වරක් කියූ දෙය නැවත නැවත කීම යනු,
1. අතිශයෝක්තිය 2. පුනරුක්තිය 3. උක්තීන් 4. ව්‍යාඛ්‍යානය

24. කුකුළා යන්නට පර්යාය පදයක් වන්නේ
1. සරණ 2. සරණවි 3. කර්කට 4. ද්විජ

25. ඔය **නැටුම්** හරියන්නේ නැතැයි ඔහු තම මිතුරියට කීවේය. **නැටුම් යන පදය**
1. තද්ධිතකි. 2. කෘදන්තයකි 3. උපසර්ගයකි 4. සමාසයකි

26. **රූපකයක් සහිත** වරණය තෝරන්න.
1. සිසිවන වුවන 2. රියසකයුරු 3. තිසරතන 4. දිසි රනලියෙව්

- අංක 27 සිට 28 දක්වා ප්‍රශ්නවල ඇති උද්ධෘත ඇතුළත් නිර්මාණ අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

27. • පොළොව හරි තදයි වගේ
• කොමඩු ගෙඩි ආගිය අතක් නැත
• යාළුවා මාත් තල්ලු කරන්න උදව් වෙන්නද ?
• අද නම් මට හැම පිහිටක්ම ඕනෑ වේවි

1. පැණි කොමඩු, මං තනන්නෝ, තොරොක්කෝව, හුණුවටයේ කතාව
2. මං තනන්නෝ, පැණි කොමඩු, තොරොක්කෝව, හුණුවටයේ කතාව
3. හුණුවටයේ කතාව, මං තනන්නෝ, පැණි කොමඩු, තොරොක්කෝව
4. තොරොක්කෝව, පැණි කොමඩු, මං තනන්නෝ, හුණුවටයේ කතාව

28. • වහන්සෙ, මෙ ඇත් චණ්ඩ යැ. පරුෂ යැ.
• විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල
• මල්ලිට නම් කොහොමත් බෑ වැඩි වේලා හැංගෙන්නට
• හිමියනි මගේ හිත වාවනු බැරිය මට

1. අමාවතුර, සැළලිහිණි සන්දේශය, හැංගි මුත්තං, ධීවරී ගීතය
2. සැළලිහිණි සන්දේශය, අමාවතුර, හැංගි මුත්තං, ධීවරී ගීතය
3. ධීවරී ගීතය, සැළලිහිණි සන්දේශය, අමාවතුර, හැංගි මුත්තං
4. හැංගි මුත්තං, ධීවරී ගීතය, අමාවතුර, සැළලිහිණි සන්දේශය

- අංක 29 සිට 31 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.

29. 1. කාන්තාවන් නිදහස තකා සටන් කළ යුත්තෝ ය
2. සිඟිත්තෝ රංගනයේ යෙදෙද්දී මම බලා සිටියෙමි.
3. කම්කරුවන් වැඩ කළහ' යි ස්වාමියා සිතුවේ ය.
4. සමහරුන් කාර්යාලයේ නැත.

30. 1. දරුවන්ගේ දෙමාපියෝ පොත් කියවත් නම් දරුවන් ද පොත් කියවති.
2. අද දරුවන් අනාගත නායකයෝ වෙති.
3. සියලු වසංගත දුරු වී රටවැසියෝ සුවපත් වේවා.
4. තෝ නිදුක් වෙහිවා.

31 1. සිංහයා පැටවුන් කැටුව ලෙන තුළට ගියේය.
2. මා ඔවුහු සමග මිත්‍රත්වයක් ඇති කර ගනිති.
3. අද කිසිම සේවකයෙකු නැත.
4. දරුවන් යහමග ගියහ'යි ගුරුවරුන් සිතති.

- හිස්තැනට ගැළපෙන වරණය තෝරන්න.

32. මම ද තෝ ද සතියකින් නොවරදවා ගමට .............
    1.එති 2. එහි 3. එමු 4. එමි

33. අනුරාධපුරයේ සිට ඔබ අමතන ............. සමන් ය.
    1. මා 2. අප 3. අපි 4. මම

34. ............ රැස්වීමට පැමිණ ඇත.
    1. විදුහල්පතිවරුන් 2. විදුහල්පතිවරු 3. ගුරුවරු 4. ගුරුවරයෙක්

- මුලින් දී ඇති පදයේ අර්ථයට නොගැළපෙන පදයක් ඇති පද පේළිය තෝරන්න.

35. දද - 1. බමුණා 2.කොඩිය 3. කුරුල්ලා 4. දිරිය

36. සමය - 1. කාලය 2. සාමය 3. ආගම 4. සමානය

37. සාමාන්‍ය ව්‍යවහාරයේ වට්ටක්කා, ගස්ලබු, කිරිඅල, වීසි කළා යන යෙදුම් සඳහා මොනරාගල ප්‍රදේශයේ භාවිත වන වදන් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

    1. අඹ, පුහුල්, කොකිස්, ගහමච්චා 2. පුහුල්, අඹ, කොකිස්, ගහමච්චා
    3. කොකිස්, ගහමච්චා, අඹ, පුහුල් 4. අඹ, කොකිස්, ගහමච්චා, පුහුල්

38. කලාකරුවන් ගමට <u>පැමිණ</u> දේශන <u>පවත්වද්දී</u> ගම්වැසියෝ <u>රොද බඳිමින්</u> ඒයට <u>සහභාගී වූහ</u>. මෙහි ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ග වනුයේ,

    1. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
    2. අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
    3. පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
    4. මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

- පහත දැක්වෙන ප්‍රකාශ අතරින් වැරදි අදහස දෙන වරණය තෝරන්න.

39. 1. පංකජ යනු නෙළුම් මලට පර්යාය පදයකි.
    2. සුමිහිරි යන පදයේ ‘සු’ යන උපසර්ග පදය විරුද්ධාර්ථයක් ගෙන දෙයි.
    3. ‘යළි’ යනු නැවත යන අර්ථයේ නිපාත පදයකි.
    4. ‘නිරන්තර’ යන්න ආගම සන්ධියට අයත් පදයකි.

40. 1. පවතින ලෝක ස්වභාවය ඉක්මවා වර්ණනා කිරීම අතිශයෝක්තිය වේ.
    2. ඡන්දස යනු ගුරු ලුහු මාත්‍රා නියමය වේ.
    3. අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් හෝ පුන පුනා යෙදීම එළිසමය වේ.
    4. උපමාව හා උපමේය යන දෙක ම එකක් ලෙස සැලකීම රූපකය වේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගය - 2020

**JMC ආයතනය මෙහෙයවන සිංහල සම්මන්ත්‍රණය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I I**

11 ශ්‍රේණිය — කාලය පැය 02 යි

❖ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

සිසු අභිමන් ප්‍රසංගයට සහභාගී වූ විද්‍යාලීය සිසුවෙක් උත්සවය අවසන් වී, අවධානයෙන් තොරව පාර මාරු වෙද්දී වේගයෙන් පැමිණි වාහනයක් ඔහු අබියසට ම පැමිණ නතර කළේය.

(ii) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(අ) යන්නෝනෑ (ආ) ගසෙහි

(iii) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදයේ ක්‍රියා වර්ගය ලියන්න.

(අ) සිසුන් දක්ෂතා <u>දක්වත</u>, ගුරුවරු සතුටු වෙති.
(ආ) හිමියනි, <u>වඩිනු මැනවි</u>.

(iv) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(අ) දඩයක්කරුවෙක් ගිරවා ද මොනරා ද දුටුවේය.
(ආ) මම ඔබ අමතමි.

(v) (අ) මිහිරක් ඇති බව දැනවීමට භාවිත වන තද්ධිත පදය ලියන්න.

(ආ) සුන්දර යන පදයට ‘ය’ ප්‍රත්‍ය එක්වීමෙන් ‘සෞන්දර්ය’ යන පදය සෑදෙන්නේ නම් මධුර යන පදයට ‘ය’ ප්‍රත්‍ය ඒක්වීමෙන් සෑදෙන පදය ලියන්න.

(vi) පහත සඳහන් වාක්‍ය නිදොස් කොට ලියන්න.

(අ) අප පාසලේ කලා උලෙළට අයිරාංගනී සේරසිංහ මැතිනියගේ පැමිණීම මා තුළ සතුටක් ඇති කළහ.
(ආ) එතෙර සංචාරයට කලාකරුවන් තිදෙනෙකු සහභාගී විය.

(vii) පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාරයේ භාවිත පද ලියන්න.
(අ) දැවා (දකුණු පළාත) (ආ) බලච්චා (මොනරාගල)

(viii) පහත සඳහන් වචන සඳහා ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ දී ඇති එක් අරුත බැගින් ලියන්න.
(අ) කලංක (ආ) කලකල

(ix) (අ) කාන්තාවෝ යන පදයේ අනියමාර්ථ ඒකවචන අනුක්ත පදය ලියන්න.
(ආ) මියුරු යන පදයෙන් හඳුන්වන පක්ෂියාගේ නම ලියන්න.

(x) ‘තාරපති අහසේ සුදිලේවී දීප්ති විහිදමිනේ’

(අ) ඉහත ගී පාදයේ එන සමාස පදයක් නම් කරන්න.

(ආ) එම සමාස පදය අයත් සමාසය ලියන්න.

(ලකුණු 02 x 10 = 20 යි)

2. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන **වචන 250 කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත ව ඇති වාපි හා වාරි මාර්ග පද්ධතිය අපේ වටිනා සංස්කෘතික උරුමයකි. එකී වාරි සංස්කෘතියෙන් ප්‍රභාවිත වූ උදාර හර පද්ධතිය ශ්‍රී ලාංකික අපේ අනන්‍යතාව වෙයි. ලෝකයේ දියුණු ම විද්‍යා හා තාක්ෂණ නිමැවුම් අභිභවා යන අපේ වාරි ශිෂ්ටාචාරය ජන සංස්කෘතියේ මූලිකාංගයකි.

**(ආ)** නිර්මාණශීලී දරුවෙකු බිහි කිරීමේ පදනම සාහිත්‍යය පරිශීලනයයි. එහෙත් වර්තමානයේ පොතපතින් ඈත් වෙමින් සිටින ළමා පරපුර දවසේ වැඩි කාලයක් අන්තර්ජාලය සමග ගත කරති. පරිගණක ක්‍රීඩා මෙන්ම හරසුන් විවිධ අන්තර්ජාල වැඩසටහන් හා සම්බන්ධ ව සිටින දරුවන්ට ක්‍රීඩා කටයුතු සඳහා ද කාලයක් නොමැත. අන්තර්ජාලයෙන් යහපත් දෑ උකහාගත හැකි වුව ද එවැනි නැඹුරුවක් ළමා පරපුර වෙතින් දිස් නොවේ.

**(ඉ)** ජාතික ආගමික හා සංස්කෘතික හර පද්ධතීන් පිළිබඳ ජනතාවගේ අවබෝධය, ජනවර්ගයා අතර විශ්වාසය, සමගිය හා සාමකාමී සහජීවනය උදෙසා ඉවහල් වේ. ශ්‍රී ලාංකිකයන් අතර පැවැත්වෙන සංස්කෘතික උත්සවවල දක්නට ලැබෙන සංස්කෘතික වටිනාකම් ද ඉහළ ය.

**(ඊ)** ජනශ්‍රැතිය අපේ සංස්කෘතියේ අංගයකි. ඒය ඉතා හරවත් ය. විවිධ ය. ජනශ්‍රැතියෙන් රටක විවිධ ජන කණ්ඩායම්වල ව්‍යවහාර විද්‍යමාන වේ. ඒ ව්‍යවහාර ඔවුන්ගේ ජන විඥානය ද කියාපායි. එමෙන් ම ඔවුන්ගේ අනන්‍යතාව රඳා ඇත්තේ ද ඒ බස් වහර තුළ ය. මේ ජන කණ්ඩායම්වලට අයත් ජනශ්‍රැති විශේෂයක් ලෙස සැලකිය හැක්කකි, ජන කවිය. ඒ ඒ ජන කණ්ඩායම්වල බස්වහර පිළිබඳ ව දැන ගැනීමට ද ජනකවිය ප්‍රබල ම උපකාරකයකි.

(ලකුණු 25 යි)

3. පහත දැක්වෙන පාඨය කියවා වචන සංඛ්‍යාව තුනෙන් එකක් වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

චිත්‍රයක් බිත්තියක ඇඳ තිබෙන්නකි. නැතහොත් පටලයක ඇඳ බිත්තියෙහි එල්ලා තිබෙන්නකි. රූපයක් කොතනත හෝ නෙළා තබා ඇත්තකි. කවියක් පොතක මුද්‍රණය කොට හෝ ලියා හෝ ඇත. නැතහොත් කවියාගේ මුවින් පිට වන විට කවියට අස්තිත්වයක්(විද්‍යමාන බව/පවත්නා බව) ඇති වේ. ගීයක් ගායනා කරන විට ගීය ඇති වේ. කතාවක් පොතක ලියා ඇත. නැතහොත් කිසිවෙකු විසින් කියන ලද කල්හි ඇති වේ.

මේ සියලුම නිදර්ශන එක සමාන නොවේ. චිත්‍රයේ අස්තිත්වයටත් රූපයේ අස්තිත්වයටත් මදක් වෙනස්ය, කවියේ හා ගීතයේ අස්තිත්වය. මුද්‍රණය කොට හෝ ලියා හෝ ඇති කවියක් ගැන නම් ප්‍රශ්නයක් නැත. ඒක දේශාර්ථයෙන් වෙතත්, චිත්‍රය හෝ රූපය මෙන් කවියත් (එනම් එහි මුද්‍රිත ස්වරූපය හෝ ලිඛිත ස්වරූපය) කොතනක හෝ තිබේ යයි කිව හැකිය. එහෙත් ලේඛන කලාව නොතිබුණු අවධියක මෙය කෙසේ වීද? කවියාගේ මුවින් කවිය පිට වී අවසන් වූ පසු කවිය ඇත්තේ කොහේද? ගීතය, ගායකයාගේ මුවින් පිට වී අවසන් වූ කල කොතන තිබේද?

කවියක් බිහි වන විට බිහි වන්නේ වචනය. ගීයක් බිහි වන විට බිහි වන්නේ ස්වරය. කවියේ වචනත් ගීයේ ස්වරත් කියා අවසන් වූ පසු කවිය හෝ ගීතය නිර්මාණය කළ කලාකරුවාගේ ශක්‍යතාවක් වශයෙන් පවතී යයි කිව හැකිය. එයින් අදහස් කෙරෙන්නේ එම කලාකරුවාට නැවතත් තම කවිය හෝ ගීය ඉදිරිපත් කළ හැකි බවය. කලාකරුවාගේ පමණක් නොව වෙන කෙනෙකුගේ ශක්‍යතාවක් වශයෙන්ද, එම කවිය හෝ ගීය පවතී යයි කිව හැකිය. ඒ කියන්නේ, එම කවිය හෝ ගීය අසා ඇති වෙන කෙනෙකුට එය යළි ඉදිරිපත් කළ හැකි බවය.

(සැබෑ මුහුණුද වෙස් මුහුණුද - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර) (ලකුණු 10 යි)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

සිනමා කෘතීන් හි එන කාව්‍යමය ස්වරූපය කෙතරම් පුළුල් ලෙස විග්‍රහ කළ ද, කෙතරම් අර්ථ නිරූපණය කිරීමට වෑයම් කළ ද එය සාර්ථක උත්සාහයක් විය නො හැකි ය. කෙසේ වුවද මෙම විෂයය පිළිබඳව තවදුරටත් සිතා බැලීමට පාඨකයාට භාර කළ යුතු වේ. කලක් මුළුල්ලේ ලෝකය පුරා විහි දී විසිරී සිටින සිනමා කලාකරුවන් විසින් නිර්මිත කථානාද චිත්‍රපට රැසක් ඔවුන්ගේ ඥාන සම්භාරය පුළුල් කර ගැනීම සඳහා ඉවහල් කොට ගත හැකි බැවින් මේ පිළිබඳ අධ්‍යයනය කිරීම කවරෙකු විසින් හෝ අත්හැර දැමිය යුතු නැත. සිනමාව පරිපූර්ණ වූ කලා මාධ්‍යයක් ලෙස මුහුකුරා වැඩී ඇතැයි තීරණය කිරීම රඳා පවතින්නේ සිනමාව ලද මෙකී ජයග්‍රහණයන් මතයි. සිනමා කෘතියක් සතු ජාතික අනන්‍යතාව, මිනිස් චිත්ත සන්තානය හා චරිත විග්‍රහ කිරීමට එයට ඇති හැකියාව, එයටම ආවේණික වූ නාටකීය ලක්ෂණ සහ කාව්‍යමය අත්දැකීම් නිර්මාණය කිරීම සඳහා එය සතු ශක්‍යතාව ද මෙහි ලා අපෙගේ සැලකිල්ලට භාජනය විය යුතුයි. කලාත්මක පක්ෂයෙන් මෙකී අරමුණ ඉටුකරගන්නා අතරම, කාර්මික පරිපූර්ණත්වය, එනම් රූප ගත කිරීම් හා පටිගත කිරීමෙහි දියුණුව, විද්‍යාත්මක පර්යේෂණ හා ප්‍රචාරක මාධ්‍යයක් ලෙස සිනමාව භාවිත කිරීමේ දී මතුවිය හැකි ගැටලු හා විෂමතාවන් ද සිනමාවේදීන් විසින් අවබෝධ කොට ගත යුතු වේ. චිත්‍රපටය යනු ප්‍රබල මාධ්‍යයකි. යම් දිනක එහි ශක්‍යතාව ජාත්‍යන්තර රූපවාහිනී ප්‍රචාරය දක්වා පුළුල් කරගතහොත් සිනමාව ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විප්ලවයක් ඇති කරනු නියතය.

(i) අර්ථ නිරූපණය කිරීමට අසාර්ථක උත්සාහයක් ලෙස ලේඛකයා ගෙනහැර දක්වන්නේ කුමක් ද?

(ii) කවරෙකු විසින් හෝ අධ්‍යයනය අත්හැර නොදැමිය යුතු කාර්යයක් ලෙස මෙහි සඳහන් වන්නේ කුමක් ද? එම අධ්‍යයනයෙන් කුමන ප්‍රතිඵලයක් අත්වන්නේ ද?

(iii) අපගේ සැලකිල්ලට භාජනය විය යුතු සිනමා කෘතියක් සතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iv) ලේඛකයා සඳහන් කරන ආකාරයට සිනමාවේදීන් අවබෝධ කරගත යුතු කරුණු අතුරින් දෙකක් ලියන්න.

(v) පහත සඳහන් වචන කෙටියෙන් පැහැදිලි කරන්න.

1. කතානාද චිත්‍රපට　　　　2. මිනිස් චිත්ත සන්තානය

(ලකුණු 02 x 5 = 10 යි)

5. පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පතක පළ කිරීම සඳහා යෝග්‍ය වාර්තාවක් සකස් කරන්න. (වචන 100ක් පමණ විය යුතුය)

කලාගම ගම්මානයේ නාට්‍ය සංගමය සංවිධානය කළ 'රඟමු ගයමු කෙටි නාට්‍ය තරගය' වාර්තා කිරීමට ගිය පුවත්පත් වාර්තාකරුවෙකුගේ සටහනක් පහත දැක්වේ.

දිනය : 2020.12.10

වේලාව : ප.ව. 3.00

ස්ථානය : කලාගම ගම්මානයේ එදිරිවීර සරච්චන්ද්‍ර ශ්‍රවණාගාරය

ප්‍රධාන ආරාධිතයින් : රාජිත දිසානායක, ජය ශ්‍රී චන්ද්‍රජිත් යන නාට්‍යවේදීන්

විනිශ්චය මණ්ඩලය : සරත් විජේසූරිය, සෞම්‍ය ලියනගේ, මංගල සේනානායක යන මහාචාර්යවරුන්, සංගීතවේදී ජයන්ත අරවින්ද, කථිකාචාරිණී හරිනි අමරසූරිය

ජයග්‍රාහී නාට්‍යය : ඇන්ටනී ජයලත්ගේ 'සඳ සහ මම'

විශේෂ දේශනය : ප්‍රවීණ විචාරක විදර්ශන කන්නන්ගර (කෙටි නාට්‍ය කලාව හා ජීවිතය )

අවසාන වටය සඳහා ඉදිරිපත් වූ නාට්‍ය සංඛ්‍යාව : නාට්‍ය හයකි.

නාට්‍ය උලෙළ සඳහා අනුග්‍රහය : මරදානේ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

සංස්කෘතිකාංග රාශියකින් විචිත්‍ර වූ එම අවස්ථාවට සහභාගී වූ 'කලා පුවත්' පුවත්පතේ විශේෂාංග වාර්තාකරු ඔබ යැයි සිතා ඉහත තොරතුරු ඇසුරින් පුවත්පත් ලිපියක් සකස් කරන්න.

නැතහොත්

සේකරගම පාසලේ සිසුහු හාරසිය පණහක් පමණ ඉගෙනුම ලබති. එහෙත් පාසල් පුස්තකාලයේ පවතිනුයේ පොත්පත් සුළු ප්‍රමාණයකි. පවතින සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගන්නා මේ පාසලේ දරුවන් සාහිත්‍ය තරගවල දී කොට්ඨාස කලාප මට්ටමින් පමණක් නොව පළාත් මටට්මේ ජයග්‍රහණ ලබා තිබේ. සේකරගම පාසලේ සාහිත්‍ය සංගමයේ ලේකම් චාමර කුලරත්න ඔබ යැයි සිතා පාසල් පුස්තකාලයට විෂය බාහිර හා විෂය සමගාමී පොත් කට්ටල කීපයක් ඉල්ලා අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යවන ලිපිය ලියන්න. 08 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල. අධ්‍යාපන අමාත්‍යවරයාගේ ලිපිනයයි.

(ලකුණු 15 යි)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගය - 2020

## JMC ආයතනය මෙහෙයවන සිංහල සම්මන්ත්‍රණය

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

11 ශ්‍රේණිය | කාලය පැය **02 යි**

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
❖ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "මම මෙහි පමාවක් නැත්තෙමි. තෙපි <u>උකටලී</u> නො වැ නොපමා වැ වසව"

(අ) ඉරි ඇඳි පදයේ අර්ථය ලියන්න.
(ආ) මෙහි පමාවක් නැත්තේ කවුද?

(ii) (අ) ගුත්තිල කාව්‍ය රචනා කරන ලෙස වැත්තෑවේ හිමියන්ට ආරාධනා කරන ලද්දේ කවුරුන් ද?
(ආ) වායු ගණයේ මාත්‍රා නියමය කුමක් ද?

(iii) (අ) 'Village in the Jungle' කෘතිය බැද්දේගම නමින් පරිවර්තනය කළ ලේඛකයාගේ නම කුමක්ද?

(ආ) 'Savage Sanctuary' , 'Vanished Trails' යන කෘතිවල කතුවරයා නම් කරන්න.

(iv) (අ) එස්.මහින්ද හිමියන්ගේ ගිහි නාමය කුමක් ද?

(ආ) එස්. මහින්ද හිමියන් රචනා කළ ජාතිකාභිමානය විදහා දැක්වෙන පද්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(v) (අ) එච්.එම්. කුඩලිගම කවියාගේ නිර්මාණ පළ වූ කවි සඟරා දෙකක් නම් කරන්න.
(ආ) එච්.එම්. කුඩලිගම කවියා ආභාසය ලැබූ භාරතීය කවියාගේ නම ලියන්න.

(vi) (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් රචනා කළ නවකතාවක් සහ විචාර කෘතියක් නම් කරන්න.
(ආ) සිංහබාහු නාට්‍යය කුමන කෘතියක් ඇසුරු කරගෙන රචනා වී තිබේද?

(vii) (අ) මහගමසේකරයන් රචනා කළ පර්යේෂණ ග්‍රන්ථය (ලේඛකයා මියයාමෙන් පසු ප්‍රකාශයට පත් වූ) නම් කරන්න.
(ආ) මහගමසේකරයන්ගේ නවකතා ද්විත්වයෙන් එක් නවකතාවක නම ලියන්න.

(viii) (අ) පරෙවි සන්දේශය ලියූ කතුවරයා නම් කරන්න.
(ආ) සැළලිහිණි සන්දේශය රචනා කිරීමේ අරමුණ කුමක් ද?

(ix) (අ) 'අමාවතුර' නම් ග්‍රන්ථය රචනා වූ සාහිත්‍ය යුගය නම් කරන්න.
(ආ) 'අමාවතුර' කෘතියේ පළමු පරිච්ඡේද තුනෙන් එක් පරිච්ඡේදයක නාමය ලියන්න.

(x) (අ) 'බිය නොවන්න අයියණ්ඩි' කාව්‍ය සංග්‍රහයේ කතුවරයා නම් කරන්න.
(ආ) පාලි ධම්මපදට්ඨකථාව කවුරුන් විසින් රචනා කරන ලද කෘතියක් ද?

(ලකුණු 02 x 10 = 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

(අ) ඉරි ඇඳි පද හා සම්බන්ධ කාව්‍යාලංකාරය සඳහන් කොට එම කාව්‍යාලංකාරය හඳුන්වන්න.

(ආ) කවියේ සමස්ත අර්ථය වැකි දෙකකින් ලියන්න.

(ii) 'අයියා' දැන් කීවානේ මගෙ මිනිහා දන්නවයි කියලා. ඉතින් මට කීවට ඇති වැරැද්ද මොකක් ද? එයා දැන් මෙහෙ ඉන්නවා ද? එයාට මොකද උණේ?

(අ) මෙම ප්‍රකාශය කරන චරිතය කුමන නමකින් හැඳින්වේද? 'අයියා' යනුවෙන් ඇමතුම් ලබන්නේ කවුද?

(ආ) 'මගෙ මිනිහා' යනුවෙන් හැඳින්වෙන පුද්ගලයාගේ නම කුමක් ද? ඔහුට මෙහි සඳහන් ස්ථානයට පැමිණීමට සිදුව ඇත්තේ කුමන හේතුවක් නිසාද?

(iii) සිනිඳු මොළොක් බව මලෙහී
පිරිසිදු බව පිනි බිඳෙහී
එක් වී මා පුතුගෙ ළෙහී
අරක් ගනී හැම දිනෙහී

(අ) ඉරි ඇඳි පදයේ අර්ථය ලියන්න.

(ආ) කවියේ සමස්ත අර්ථය කෙටියෙන් ලියන්න.

(iv) ...ඇගේ ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමී' මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙන පයි ඇඳීමෙන් හැරී ගොසින් රට මුළුල්ලේ ශිල්ප පෑ ගෙන ඇවිදිනෝ,

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v) "අය්යෙ, අය්යෙ, පොලිස්කාරයෙක්!" හදිස්සියේ ම හති ලමින් අප වෙත දුව ගෙන ආ පොඩි මල්ලී දෑත් වනමින් මට කතා කළේ ය.

(අ) 'පොලිස්කාරයෙක්' ලෙස සඳහන් වන පුද්ගලයාගේ වෘත්තිය කුමක් ද? එම වෘත්තිය ගැමි ජනයා කුමන නමකින් හඳුන්වයිද?

(ආ) 'පොලිස්කාරයෙක්' ලෙස සඳහන් වන පුද්ගලයා පැමිණයේ කාගේ නිවසට ද? කුමන කාර්යයක් සඳහා ඔහු පැමිණියේ ද?

(ලකුණු 04 x 5 = 20 යි)

3. (i) සුප්පා දේවිය දාරක ස්නේහයත්

(ii) ස්වාමි භක්තියත්

අතර උභතෝකෝටිකයකට මැදිවන කාන්තාවකි. සිංහබාහු නාටකයේ ඔබට නියමිත කොටස ඇසුරින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

(i) බැද්දේගම හා එහි වැසියන් ක්‍රමයෙන් අභාවයට යන ආකාරයත්

(ii) පුංචි මැණිකාගේ චරිතයත්

මනාව නිරූපණය සඳහා භාෂාව නිර්මාණාත්මක ව භාවිත කර ඇති අයුරු බැද්දේගම නවකතාවේ ඔබට නියමිත කොටස ඇසුරින් විමසන්න.

(ලකුණු 15 යි)

4. (i) ධර්මසේන හිමියන්ගේ කථා කලාවේ සුවිශේෂත්වයත්

(ii) හාස්‍ය හා උපහාසයෙන් යුතුව චරිත නිරූපණයට දක්වන කුසලතාවත්

උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව ඇසුරින් විමසන්න.

**නැතහොත්**

(i) කුරක්කන් වගාවේ දී ගැමියා මුහුණ දෙන අනේකවිධ දුක්ගැහැට අව්‍යාජත්වයෙන් යුතුව නිරූපණයත්

(ii) සරල හා සංක්ෂිප්ත ලෙස භාෂා භාවිතයත්

'කුරහන් ඉසිමුව කළුවර බලාලා' කවි පන්තිය ඇසුරින් විමසන්න.

(ලකුණු 15 යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ අපූර්ව කවි ශක්තියට සැළලිහිණි සන්දේශය ප්‍රබල සාක්ෂියකි. 'මහ විසිතුරු' පාඩම ඇසුරින් විමසන්න.

(ලකුණු 10 යි)

6. "මහගමසේකරයන්ගේ ප්‍රාර්ථනය මතුපරපුර වෙනුවෙන් යහපත් රටක් බිහිවනු දැකීමයි." මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ මතය 'දැතේ කරගැට සිඹ සනසන්නට' පැදි පෙළ ඇසුරින් විමසන්න.

(ලකුණු 10 යි)

7. අවස්ථා හා සිද්ධි නිරූපණයට ගුරුළුගෝමී පඬිවරයා දක්වන විස්මය ජනක කුසලතාව පිළිබඳ 'අඟුල්මල් දමනය' ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

**මෙහෙයවීම**
**ප්‍රවීණ සිංහල දේශක**
**මහේන්ද්‍ර මද්දේගම**